# Sinhalese A: literature – Standard level – Paper 2
# Singhalais A : littérature – Niveau moyen – Épreuve 2
# Singalés A: literatura – Nivel medio – Prueba 2

Monday 11 May 2015 (morning)
Lundi 11 mai 2015 (matin)
Lunes 11 de mayo de 2015 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

### Instructions to candidates

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied and compare and contrast these works in response to the question. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.
- The maximum mark for this examination paper is **[25 marks]**.

### Instructions destinées aux candidats

- N’ouvrez pas cette épreuve avant d’y être autorisé(e).
- Traitez un seul sujet de composition. En basant votre réponse sur au moins deux des œuvres de la troisième partie que vous avez étudiées, vous devez comparer et opposer ces œuvres dans le cadre du sujet. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la troisième partie n’obtiendront pas une note élevée.
- Vous n’êtes pas autorisé(e) à apporter des exemplaires des œuvres que vous avez étudiées dans la salle d’examen.
- Le nombre maximum de points pour cette épreuve d’examen est de **[25 points]**.

### Instrucciones para los alumnos

- No abra esta prueba hasta que se lo autoricen.
- Conteste una sola pregunta de redacción. Base su respuesta en al menos dos de las obras estudiadas de la Parte 3, comparándolas y contrastándolas en relación con la pregunta. Las respuestas que no se basen en al menos dos obras de la Parte 3 no recibirán una puntuación alta.
- No está permitido traer copias de las obras estudiadas a la sala de examen.
- La puntuación máxima para esta prueba de examen es **[25 puntos]**.

2215 – 0180



© International Baccalaureate Organization 2015

https://xtremepape.rs/

පහත සඳහන් ප්‍රශ්න අතුරින් **එක් ප්‍රශ්නයකට** පමණක් පිළිතුරු සපයන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් **යටත් පිරිසෙයින් දෙකක් වත්** ඔබේ පිළිතුරට පදනම් විය යුතු වන අතර ප්‍රශ්නයට අදාළ වන සේ එම කෘති **සන්සන්දනාත්මක ව විමර්ශනය කළ යුතුය.** 3 වන කොටසෙන් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොට ගෙන **නොමැති** පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

**සම්භාව්‍ය සාහිත්‍යය**

1. "පැරණි ලේඛකයින්ගේ පරමාර්ථය වූයේ තම කෘතිවලින් ගුණ ධර්ම පිළිබඳව දැනුමක් හා අවබෝධයක් ලබාදීමටයි." මෙම ලේඛකයින් සිය පරමාර්ථය ඉෂ්ට කර ගැනීමට යොදා ගත් රචනෝපක්‍රම සහ ඒවා කෙතරම් දුරට සාර්ථකව යොදා ගෙන ඇත්දැ යි ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් විමසන්න.

2. සම්භාව්‍ය යුගයේ සිංහල ගද්‍ය කර්තෘවරුන් සිය කෘතිවල මනුෂ්‍යත්වය සානුකම්පිකව දක්වාලීමට යොදා ගත් සාහිත්‍ය උපක්‍රම කවරේ දැයි ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

3. "සම්භාව්‍ය යුගයේ සිංහල කර්තෘවරුන් වාග් බාහුල්‍යය සහ උපමා රූපක යොදමින් සිය නිර්මාණ කෘති රචනා කොට ඇත්තේ පාඨකයින්ට වඩා ශ්‍රාවකයින් උදෙසා ය." ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් මෙම සාහිත්‍ය උපක්‍රම කෙතරම් දුරට එම පරමාර්ථය ඉෂ්ට කර ගැනීමට හේතු වී ඇත්දැ යි විභාග කරන්න.

**නාට්‍යය**

4. "ශෛලීගත සම්ප්‍රදාය අනුගමනය කළ සිංහල නාට්‍යවල පැරණි කාව්‍යමය භාෂාව, මිථ්‍යා කථා සහ රාජ පුරුෂයින්ගෙන් යුතු වූ කථා වස්තු අඩංගු වුව ද, එම ලක්ෂණ මේ නාට්‍යයන් ප්‍රේක්ෂකයින් අතර ජනප්‍රිය වීමට බාධාවක් නොවීය." ඔබ හදාරා හෝ නරඹා ඇති නාට්‍ය දෙකක් ඇසුරෙන් මෙම කියමන විමර්ශනය කරන්න.

5. "වර්තමාන සිංහල නාට්‍යකරුවන්ගේ අභිප්‍රාය ව ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදනවලින් සමකාලීන සමාජ තත්වය නිරූපනය කොට නාට්‍ය රසයක් ජනිත කරලීමටයි." ඔවුන් මේ සඳහා යොදා ගත් නාට්‍ය විධි කවරේ දැ යි ඔබ හදාරා හෝ නරඹා ඇති නාට්‍ය දෙකක් ඇසුරු කර ගනිමින් සාකච්ඡා කරන්න.

6. වර්තමාන සිංහල දෙබස් නාට්‍යවල නාට්‍යමය අවස්ථාවන් සහ භාෂා විලාසය සංකලනය කර ගෙන ඇති ආකාරය සහ යොදා ගෙන ඇති උපක්‍රම ඔබ හදාරා හෝ නරඹා ඇති නාට්‍ය දෙකක් පදනම් කර ගනිමින් විභාග කරන්න.

https://xtremepape.rs/

**නවකථාව**

**7.** **"නවකථාවක නිරූපිත චරිත හා ඒවායේ සංකීර්ණ බව රඳා පවත්නේ කර්තෘවරයා තුළ භාෂාව හැසිරවීමට ඇති කුසලතාව මත යි." ඔබ හදාරා ඇති නවකථා දෙකක් ඇසුරු කරගනිමින් මෙය විමසන්න.**

**8.** **"උත්තම පුරුෂ ආඛ්‍යානය යොදා රචිත නවකථාවල නිරූපිත ප්‍රධාන චරිත මුහුණ දෙන සෑම අවස්ථාවක් සමගම පාඨකයාට බැඳී සිටීමට මැනවින් ප්‍රස්ථාව ලැබේ." ඔබ කියවා ඇති සිංහල නවකථා දෙකක් පාදක කරගනිමින් මෙම කියමන සාකච්ඡා කරන්න.**

**9.** **ඔබ හදාරා ඇති නවකථා දෙකක් ඇසුරු කරගනිමින් නවකථාකරුවා සිය කෘතිවල අඩංගු චරිත නිරූපණය කිරීමෙහි ලා දෙබස් යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.**

**නූතන පද්‍ය**

**10.** **ගැමි ජීවිතයේ සුන්දරත්වය දැකීමට මෙන්ම එහි ඇති දුක්බර අංශය දෙස සානුකම්පිකව බැලීමට ද නූතන සිංහල කවියන් යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම සහ ඒවා යොදා ගෙන ඇති ආකාරය ඔබ හදාරා ඇති කාව්‍ය නිර්මාණ දෙකක් ඇසුරින් විමසන්න.**

**11.** **කවියා සිය අත්දැකීම් කවි සිතුවිලි බවට පරිවර්තනය කිරිමට යොදාගන්නා උපක්‍රම ඔබ හදාරා ඇති පද්‍ය නිර්මාණ දෙකක් ඇසුරින් පහදන්න.**

**12.** **"තම කාව්‍යවල අන්තර්ගත අත්දැකීම් මැනැවින් ඉදිරිපත් කිරීමට කවියා ශබ්ද රසය විවිධාකාරයකින් යොදා ගනී." ඔබ හදාරා ඇති පද්‍ය නිර්මාන දෙකක් පාදක කොටගෙන මෙය විභාග කරන්න.**

**කෙටිකථාව**

**13.** **"සියල්ල අබිබවා සිටින එක් ප්‍රබල සිද්ධියක් හෝ කැපී පෙනෙන එක් ප්‍රධාන චරිතයක් හෝ අඩංගු වී තිබීම කෙටිකතාවකට ආවේනික වූ ලක්ෂණයකි." ඔබ හදාරා ඇති කෙටිකතා දෙකක් ඇසුරින් මෙය වීමසන්න.**

**14.** **කෙටිකතාවක මානව සම්බන්ධතා නිරූපණය කරන ආකාරය ත් එය ඉෂ්ට කර ගැනීමට කර්තෘවරයා යොදා ගන්නා උපක්‍රම ත් ඔබ කියවා ඇති කෙටිකතා දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.**

**15.** **"කෙටිකතාකරුවා තම මූලික අභිප්‍රාය නිරූපණය කිරීමට ප්‍රමාණවත් වන පරිදි දැඩි අරපිරිමැස්මකින් භාෂාව පරිහරණය කළ යුතු ය." ඔබ කියවා ඇති කෙටිකතා දෙකක් ඇසුරු කරගනිමින් මෙම ප්‍රකාශය විමසන්න.**

https://xtremepape.rs/